# අරුම පුදුම නිධානය



කතා : ඔවිනි දුලක්නා දිසානායක

අරුම පුදුම නිධානය

**කතෘ** : **ඔවිනි දුලක්නා දිසානායක**

**කතෘ ගේ වෙනත් කෘති** : **නදී සහ සිනිඳු (2020)**

**කෘතිය පලකරන දිනය** : 15/11/2023

ISBN **අංකය** : ISBN 978-624-206-724-7

Wondershare PDFelement

# පිදුම

මාගේ ආදරණීය දෙමපියන්ට
සහෝදර සහෝදරියන්ට
මගේ දයාබර යහළු යෙහෙළියන්ට
පෙර පාසල් වියේ සිට මේ දක්වා දැනුමෙන් පෝෂණය
කළ ගුරුමෑණිවරුන්ට හා පියවරුන්ට
සාදරයෙන් පිළිගන්වමි.

Wondershare
PDFelement

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාපෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකමත් එක කාලයක ජුලී කියලා ගෑණු ළමයෙක් ජීවත් වුණා. මේ අය හරිම දුප්පත්, කුලී වැඩ කරමින් පවුල ජීවත්කරවන පියාට වැඩක් නොලැබී යන සමහර දවසට මිදුලේ අඹ ගස යටට වී කල්පනා කරන අයුරු ජුලී දුකෙන් බලා සිටියා.

Wondershare PDFelement



මල් විකුණා උපයා ගන්නා සුළු ආදායමින් ජූලීගේ මව පියාට සහය වෙනවා. ඇගේ අම්මා සහ තාත්තා වැඩට ගියපසු අත්තම්මා නංගී සහ මල්ලී බලාගන්නවා . ජූලී ගියේ ගමේ පාසලට, ඇය පාසලේ සිටින දක්ෂ ශිෂ්‍යයාවක් , ජූලී ගුරුවරුන්ගේද සිත් දිනා ගනිමින් අධ්‍යාපන කටයුතු ඉටුකලා. අත්තම්මා දර සොයන්න ගියවිට ජූලී නංගී සහ මල්ලී සමඟ මුහුදු වෙරළට ගොස් බෙල්ලෝ එකතු කර කඩවලට විකුණා සුළු මුදලක් ලබාගන්නවා . එම මුදල් ඇගේ පොත් පත් මිලදී ගැනීම සඳහා යොදා ගන්නවා. වෙනදා වගේ ම ජූලී නංගී සහ මල්ලී සමඟ මුහුදු වෙරළට ගොස් සෙල්ලම් කරමින් සිටින විට අමුතු වීදුරු බෝතලයක් වෙරළට ගසා ගෙනවිත් ඇති අයුරු දුටුවා.



ජුලී සෙමෙන් සෙමෙන් බෝතලය ළඟට ගියා. ඇය බෝතලය විවෘත කර ඇතුළේ තිබුණු දම් පැහැති කොළය එලියට ගත්තා . එහි අමුතු අකුරු හා රේඛා දක්නට ලැබුණා. එහි යම් කිසි දෙයක් සොයාගැනීමට මඟ පෙන්වීමක් ඇති බව ඇයට වැටහුනා . එහි යම් කිසි වටිනා දෙයක් පිළිබඳව සඳහන්ව ඇති බව ජුලී තේරුම් ගත්තා. ඇගේ ඉහේ මලක් පිපුණා වැනි හැඟීමක් ඇති වුණා.

ගෙදර දිව ගිය ඇය අම්මා සහ තාත්තා එනතුරු මඟ බලාගෙන සිටියා. අම්මාගේ අතේ මල් ගොඩක් ඉතිරි වී ඇති බව ජුලී දුටුවා. ඇයට ගොඩක් දුක හිතුණා. තාත්තටත් මහන්සි නිසා ජුලී හිතුවා මේ ගැන හෙට උදෑසනින්ම කියන්න. අම්මටයි තාත්තටයි කියන තුරු ඇ

සිටියේ නොඉවසිල්ලෙන්, ඇය සිහින මැව්වේ ඉක්මනට පොහොසත් වෙන්නයි. ඇය මේ ගැන අම්මාටයි තාත්තාටයි කිව්වා. නමුත් අම්මයි තාත්තයි කීවේ කව්රු හරි සෙල්ලම් කරන්න ඇදලා දාපු එකක් කියලයි. නමුත් ජුලි ඒ දේ පිලිගත්තේ නැහැ .

ජුලී එයාගේ යහළුවෝ දෙන්නක් වුන නදීට හා මලීට මේ ගැන කිව්වා. එහි සඳහන් රේඛා හා අක්ෂර පරණ පොතක් ආධාරයෙන් සොයා බැලූ ඔවුන් එය නිධානයක් වියහැකියි සිතා ගත්තා. ඒ අනුව නිධානය තිබෙන තැනට යෑමට තීරණය කලා. හෙට සෙනසුරාදා නිසා අපි හෙට යමු කියලා මලී කිව්වා. එයට ජුලී හා නදී කැමති වුණා. නමුත් ජුලී මේ ගැන අම්මටයි තාත්තටයි කිව්වේ නැහැ. පසුවදා ජුලී අම්මයි තාත්තයි වැඩට ගියපසු

Wondershare PDFelement

යහළුවන් දෙදෙනා සමඟ ගමන යෑමට ගෙදරින් පිටවුණා. යහළුවෝ තුන්දෙනා බයෙන් බයෙන් වනයට ඇතුළු වුණා.

ටික දුරක් ගියපසු ගොරවන ශබ්දයක් යහළුවෝ තිදෙනාට ඇසුණා. බියවී දුවන විට නදීගේ කකුල පැටලී වැටුණා. ආපසු හැරී ඇවිත් නදීව ඔසවාගන අසල තිබූ ගලකට නැග්ගා. පසුව විපරම් කර බලන විට දිවියෙක් මුවකු පසුපස එලවා යන අයුරු ඔවුන් දුටුවා. උන් ඇතට දිවගිය පසු ඔවුන් ගලෙන් බැස ලේ ගලායන නදී ගේ කකුලට කැලෑවෙන් සොයාගත් බෙහෙත් කොළ තුවාලය මත තැවරුවා. බියටපත් ඔවුන් බලාපොරොත්තු ඉටුනොවූ නිසා ආපසු නිවස බලා පැමිණියා.

නිවසට පැමිණෙන අතරතුරදී ඔවුන්ට මලිත් අයියාව හමුවුණා. “කකුලත් තුවාල  කරගෙන කොහෙද මේ තුන්දෙනා යන්නේ”  මලිත් අයියා ඇසුවා.  ඔවුන් මේ ගැන මලිත් අයියාට කිව්වා. මලිත් අයියාත් ඔවුන් සමඟ හෙට යෑමට කැමති වුණා. උදෑසනින්ම අවදි වූ  ජූලී අම්මයි තත්තයි වැඩට ගියපසු අත්තම්මාට හොරෙන් ගෙදරින් පිට වුණා. ජූලී කැලෑවට යනවිට මලී සහ මලිත් අයියාත් ජූලී පැමිණෙන තුරු බලා සිටියා. එහෙත් නදී නම් ගමන යෑමට පැමිණ සිටියේ නැහැ .  සමහර දවසට ජූලීගේ ගෙදර වේල් තුනටම කන්න තිබුණේ නැහැ. නංගීයි මල්ලීයි බඩගිනිවෙලා හඬන හැටි ජූලීට මැවිලා පෙනුණා.   ඒ නිසා ජූලීට ඕනෑ වුනේ කොහොම හරි පොහොසත් වෙන්නයී.

Wondershare PDFelement

නිධානය සළකුණු කරලා තියෙන තැනට කැලෑව මැද්දෙන් සෙමෙන් සෙමෙන් ළඟා වුණා. ජුලී සිටියේ හරිම සතුටින් නිධානය සළකුණු කරලා තිබුණේ දිය ඇල්ල පිටුපසින් තිබුණු ගල් ගුහාවකයි.

ටික දුරක් යනවිට දිය ඇල්ලක් අදෙහැලෙන හඬ ඇසුණු අතර ඒ දෙසට ඔවුන් ළඟා වුණා.

Wondershare PDFelement



ඉතා අමාරුවෙන් වතුරට බැස සෙමින් සෙමින් යනවිට ජුලීගේ පය ලිස්සා ඇද වැටුණා. මලිත් අයියා වතුරට පැන ඇය අල්ලා ගත්තා. වතුර පිසදා ගත් ජුලී ඇගේ උත්සහය අත නොහැරියා. ඉතා අමාරුවෙන් ගුහාව සොයාගත් ඔවුන් සෙමෙන් සෙමෙන් ගුහාව තුලට ඇතුළු වුණා. මුළු ගුහාවම අඳුරෙන් වැසී තිබුණා. මලිත් අයියා ගෙනා විදුලි පන්දමේ එළියෙන් ඔවුන් කිසිවක් ඇතිදැයි සොයා බැලුවා. ගල්ලෙනේ අයිනක කුඩා පෙට්ටියක් තිබෙනවා ඔවුන් දුටුවා.



ජුලී දුව ගොස් පෙට්ටිය ඇරීමට උත්සහ කලා. ඒ ගැන ඇ සිටියේ නොඉවසිල්ලෙනි. මලිත් අයියාගේ උදවු ඇතිව ඉතා ආමාරුවෙන් පෙට්ටිය ඇරියා. පෙට්ටිය තුල දම්පැහති කොලයක් පමණක් තිබෙනවා ඔවුන් දුටුවා. ජුලීට අදහාගත නොහැකි වුණා. කොළය උදුරගත් ඇය එය කියවා බැලුවා. උත්සහය, උනන්දුව , කැපවීම තිබේනම් නිධානයක් සොයා ගත හැකි බව එහි සදහන්ව තිබුණා. ජුලීට මේ ගැන පුදුම හිතුණා. ආපසු හනිකට නිවස බලා පැමිණීමට පිටත්වුණා. ඇය මලීට හා මලිත් අයියාට සමු දී ගෙදර ගියා. හොදටම හවස් වී තිබු නිසා අත්තම්මා මේ ගැන ප්‍රශ්න කලා.

‘‘අත්තම්මේ මම ඔයාට හැමදේම හෙට උදේට කියන්නම්’’ දැන් මට හරිම මහන්සියි කියා ජුලී නින්දට වැටුණා. පසුදා උදේ තේ කෝප්පය රැගෙන ජුලී අසලට ගිය අත්තම්මා සිදු වූ සියල්ල විමසුවා. සියල්ල අත්තම්මාට පැහැදිලි කරන විට ඇගේ ඇස් වලින් කඳුළු බිංදු කඩා වැටුණා. ජුලීව තුරුලු කරගත් ඇය කරුණු පහදා දුන්නා. “පුතේ අපි දියුණු වෙන්න ගොඩක් මන්සි වෙන්න ඕන’’ උත්සාහය, උනන්දුව, කැපවීම තිබුණොත් අපිට අපේ අරමුණු ළගාකරගත හැකියි. අත්තම්මා ජුලීගේ පුංචි සිත හදන්න ගොඩක් මහන්සි වුණා. හොදින් අධ්‍යාපන කටයුතු ඉටුකොට හොද රැකියාවක් කර පවුලට ශක්තියක් වීමට පුංචි ජුලී අධිෂ්ඨාන කරගත්තා.

නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට

පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01